**මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය - 2019**

**-------------------------------------------------------------**

මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹී අංක 2557 හා 2558 එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුම්වල II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයැයි සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. කොළඹ මහ නගර සභාව විසින් මහ නගර සභා ප්‍රදේශය ඇතුළත කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ වගකීම දරන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කොලොන්නාව නගර සභාව හා දෙහිවල ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශ ඇතුළත කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ වගකීම දරනු ලැබේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මනා අපජල කළමනාකරණ සේවාවක් සැපයීම තුළින් මහ කොළඹ ප්‍රදේශයේ, නාගරික හා උප නාගරික නිවැසියන්ගේ නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය සේවා වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. අදාල ප්‍රදේශය තුළ ජීවත්වන නිවැසියන් 645,000 ක් සඳහා අපජල කළමනාකරණ සේවා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිඵලය වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,410 කට සමාන එ.ජ.ඩො මිලියන 116.60 ක් වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු.මිලියන 1,731.70 කට සමාන එජඩො මිලියන 12.60 ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ඉන් රු.මිලියන 1,367.35 කට සමාන එජඩො මිලියන 9.40 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණු අතර ඉතිරි මුදල වන රු.මිලියන 364.35 කට සමාන එජඩො මිලියන 3.20 ක මුදල මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. 2009 දෙසැම්බර් 18 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 මාර්තු 30 දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද, ව්‍යාපෘති කාර්යයන් 2019 දෙසැම්බර් 31 දින දක්වා කර ගෙන ගොස් තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 02 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතියේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ව්‍යාපෘතියේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය සියළු ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරිම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | බලපෑම් | කලමනාකරණයේ අදහස් දැක්වීම් | විගණනකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දින දක්වා ගෙවන ලද එකතු කිරීමේ අගය මත බදු ශ්‍රී ලංකා රජයෙන් ලත් දායකයට එරෙහිව හිලව් කර තිබුණි. | 72,190,356 | රජයෙන් ලත් දායකය අව ප්‍රමාණ වේ. | එකතු කිරීමේ අගය මත බදු රජයේ දායකත්වයට එරෙහිව හිලව් කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ප්‍රතිපත්තියක් වේ. | ශ්‍රී ලංකා රජයෙන් ලත් සම්පූර්ණ දායකත්වය මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව දැක්විය යුතුය. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති විශේෂ ඩොලර් ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | 21,432,660 | මුදල් හා මුදල් සමානදෑහි ශේෂය අව ප්‍රමාණය වේ. | ඩොලර් ගිණුමේ ශේෂය ඒ.ඩී.බී වෙත ආපසු යැවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | විශේෂ ඩොලර් ගිණුමේ පැවති ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ කරන ලද ඍජු ගෙවීම් වටිනාකම රු.මිලියන 95.87ක් විය. කෙසේ වුවද, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද වාර්තාවල එය රු.මිලියන 97.90ක් ලෙස දක්වා තිබුණි. | 2,026,998 | මූල්‍ය ප්‍රකාශනවල විදේශ උපයෝජනයන් අව ප්‍රමාණය වේ. | වෙනස සඳහා සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කළ යුතුය. | කාලීනව ශේෂ සැසඳුම් කල යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය තුළ බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා දරන ලද රු.මිලියන 1.52 ක වියදම සනාථ කර ගැනීමට අදාල විගණන සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, භාර දෙන ලද පිළිවෙළින් වටිනාකම රු.මිලියන 6.77 ක් හා රු.මිලියන 16.84 ක් වූ ජංගම | 25,147,955 | විගණන විෂය පථය සීමා කිරීම. | අදහස් දක්වා නොමැත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයන් තහවුරු කිරීම සඳහා උපකාරක ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |

නොවන වත්කම් හා ජංගම වත්කම්වලට අදාල සාක්ෂි, ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණ ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3. මූල්‍ය කාර්යය සාධනය

#### 3.1 මූල්‍ය ප්‍රගතිය

| විගණන ගැටලුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ වී 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ක් ගත වී තිබුණද, එ.ජ.ඩො මිලියන 9.40 ක් වූ වෙන් කිරීම් වලින් එ.ජ.ඩො මිලියන 7.70 ක් පමණක් උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය 2017 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණ කර තිබුණ ද, එ.ජ.ඩො මිලියන 1.70 ක් වූ ඉතිරි ණය ශේෂය ආසියානු සංවර්ධන බැංකුව වෙත ආපසු යැවීමට 2020 ජුනි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | සමථයකට පත් නොවූ උපයෝජන නොවූ ශේෂ පැවතීම. | අදහස් දක්වා නොමැත. | ප්‍රමාද නොවී ණය ශේෂය ආසියානු සංවර්ධන බැංකුව වෙත ආපසු යැවිය යුතුය. |

#### 3.2 පද්ධති හා පාලන

| විගණන ගැටලු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (ඇ) 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යය අවසන් කර තිබුණද, ව්‍යාපෘති නිම කිරීමේ වාර්තාව පිළියෙළ කර නොතිබුණි. | ව්‍යාපෘති කාර්යයන්ගේ ප්‍රතිඵල මැනීමට නොහැකි වේ. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති කාලය අවසානයේ ව්‍යාපෘතිය නිම කිරීමේ වාර්තාව පිළියෙළ කළ යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 133 සහ 2016 ජුනි 10 දිනැති කළමනාකරණ විගණන චක්‍ර ලේඛ අංක 02/2016 පරිදි සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ ගනුදෙනු සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ මූල්‍ය හා ක්‍රියාකාරී කටයුතු සම්බන්ධ දුර්වල පාලනය, ව්‍යාපෘතියේ කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැක. | අදහස් දක්වා නොමැත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |